**22-01-2023 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1993/11/25**

**පහසු සාර්ථකත්වය අත්විඳීම සඳහා, ඥාන ප්‍රතිමූර්ති වන ජීවාත්ම වී, දැනුම සමග අත්හදා බැලීම් සිදු කරන්න.**

අද දින, ආශිර්වාද පිරිනමන්නා සහ දැනුම පිරිනමන්නා, ග්‍යානී සහ යෝගී ජීවාත්ම වන ඔහුගේ දරුවන් දෙස බලනවා. ඔය සෑම කෙනෙක්ම කෙතරම් දුරට දැනුමේ ප්‍රතිමූර්තියක් සහ යෝග්යුක්ත වී සිටිනවාද? ඔබ උපකරණ වී ඇත්තේ දැනුමට සවන් දීමට සහ එය පැවසීමට පමණයිද? එසේ නැත්නම් ඔබ දැනුමේ ප්‍රතිමූර්ති බවට පත් වෙලාද? ඔබ කාලයට අනුව යෝගාවේ සිටින අය වෙලාද, නැත්නම් ඔබට නිරන්තරයෙන් යෝගී දිවියක් තිබෙනවාද, එනම්, ඔබ සෑම ක්‍රියාවකදී ස්වාභාවිකව සහ නිරන්තරයෙන් යෝග්යුක්ත සහ යුක්තියුක්තද? යම් කෙනෙක් බ්‍රහ්මීණ් ජීවාත්මයකගෙන්, ඔහු ග්‍යානීද, යෝගීද කියා විමසන විට, ඔහු කුමක් කියයිද? ඔබ සියලු දෙනාම ග්‍යානී සහ යෝගී ජීවාත්ම නේද? ඔබ සියලු දෙනාම මෙයද? දැනුමේ ප්‍රතිමූර්තියක් වීම යනු, සෑම සිතිවිල්ලක්, වචනයක් සහ ක්‍රියාවක්ම බලවත් වීමයි. නිෂ්ඵල සියල්ල අවසන් වී තිබෙයි, මන්ද, බලවත් යමක් ඇති තැනක කිසිම නිෂ්ඵලත්වයක් තිබිය නොහැක. ආලෝකය සහ අන්ධකාරයට එකට පැවතිය නොහැකි සේම දැනුම, ආලෝකය වන අතර නිෂ්ඵල සියල්ල අන්ධකාරයයි. ප්‍රධානතම දේ වන්නේ ඔබගේ සිතිවිලි බීජ බලවත් කරගැනීමයි. ඔබගේ සිතිවිලි බීජ බලවත් නම්, එවිට ඔබගේ වදන්, ක්‍රියා සහ නෑ සබඳතා ඉබේටම බලවත් වනවා. එබැවින් දැනුමේ ප්‍රතිමූර්තියක් වීම යනු සෑම මොහොතක්, සෑම සිතිවිල්ලක් සහ සෑම තත්පරයක්ම පහසුවෙන් බලවත් වීමයි.

ඔබ සියලු දෙනාම යෝගී ජීවාත්ම බවට පත්වී ඇත, නමුත් සෑම සිතිවිල්ලක්ම ස්වාභාවිකවම යෝග්යුක්ත සහ යුක්තියුක්ත වීම අතින්, එය අංකානුරූපයි. අංකයක් තිබෙන්නේ ඇයි? පිරිනමන්නා එක්කෙනෙක් වන අතර ක්‍රමවේදයද එකම වන බැවින්, අංකයක් තිබෙන්නේ ඇයි? ඔබ සියලු දෙනාම යෝගීවරු වී ඇති බව බාප්දාදා දුටුවා, නමුත් ඔබ අත්හදා බැලීම් සිදු කරන්නේ ඊට අඩු ප්‍රමාණයකටයි. යෝගාවේ සිටීමේ සහ යෝගාව මෙහෙයවීමේ ඔබ සියලු දෙනාම දක්ෂ වී ඇත. යෝගාව මෙහෙයවන අන්දම ඔබ නොදන්නා බව, ඔබගෙන් කිසිම කෙනෙක් කියයිද? ඔබට යෝගාවේ සිටීමට සහ යෝගාව මෙහෙයවීමට හැකියාවක් ඇති සේම ඒ අන්දමින්ම ඔබ යෝගීවරු වී, එපමණින්ම අන් අයවත් යෝගාව සමග අත්හදා බැලීම් කිරීමට හැකි අය බවට පත් කළ යුතුයි. මෙය, යෝගී දිවියක්, යෝග්යුක්ත දිවියක් ලෙස හැඳින්වෙයි. එබැවින් දැන්, මෙම අත්හදා බැලීමේ දිවියක අවශ්‍යතාවයක් තිබේ. යෝගාවේ අර්ථ විග්‍රහය ලෙස ඔබ දන්නා සහ පවසන සියලුම විශේෂතා සමග ඔබ අත්හදා බැලීම් සිදු කරනවාද? ඔබගේ සංස්කාර පරිවර්ථනය කිරීමට අත්හදා බැලීම් සිදු කරන කෙනෙක් බවට ඔබ කොපමණ ප්‍රමාණයකට පත්ව සිටිනවාද කියා ප්‍රථමයෙන් තමන්ව පරීක්ෂා කර බලන්න, මන්ද, ශ්‍රේෂ්ඨ ලෝකය නිර්මාණය වීමේ අත්තිවාරම වන්නේ ඔබගේ ශ්‍රේෂ්ඨ සංස්කාරයි. අත්තිවාරම ශක්තිමත් නම්, එවිට අනෙක් සියලුම දේ ශක්තිමත් වීම ඉබේටම සහතික වෙයි. එබැවින් අවශ්‍ය වෙලාවකදී ඔබගේ සංස්කාර ඔබව මුලා නොකරන බව පරීක්ෂා කර බලන්න. ජීවාත්මයකගේ ශ්‍රේෂ්ඨ සංස්කාර වෙනස් කිරීමට, යම් පුද්ගලයෙක්, යම් දෙයක් හෝ යම් සිදුවීමක්, කෙතරම් වෙර දැරුවත්, යෝගාව සමග අත්හදා බැලීම් සිදු කරන ජීවාත්මයක්ව චංචල කිරීමට හෝ එම ජීවාත්මය ශ්‍රේෂ්ඨත්වයෙන් සාමාන්‍ය බවට පත් කිරීමට, කිසිම දේකට නොහැකි වෙයි. එය මෙසේ නොවිය යුතුයි සිදුවීම මෙවන් එකක් විය, ඒ පුද්ගලයා මෙවන් කෙනෙක් හෝ වාතාවරණය ඒ අන්දමේ එකක් විය, ඔබගේ ශ්‍රේෂ්ඨ සංස්කාර ඔබ වෙනස් කර ඒවා සාමාන්‍ය හෝ නිෂ්ඵල බවට පත් කළේ ඒ නිසයි. එවන් ජීවාත්මයක්ව, අත්හදා බැලීම් සිදු කරන ජීවාත්මයක් ලෙස ඔබ හඳුන්වයිද? නිසි වෙලාවට ඔබට යෝගා බලය භාවිතා කළ නොහැකි නම්, ඔබ එය හඳුන්වන්නේ කුමක් කියාද? එබැවින් ප්‍රථමයෙන් ඔබගේ අත්තිවාරම පරීක්ෂා කර බලන්න ඔබ නිසි වෙලාවට යෝගාව සමග අත්හදා බැලීම් සිදු කරන කෙනෙක් බවට කෙතරම් දුරට පත්වී සිටියිද? ඔබ තවමත් තමන්ගේම සංස්කාර පරිවර්ථනය කරන අය බවට පත් වී නොමැති නම්, ඔබ නව ලෝකයට පරිවර්ථකයන් වන්නේ කෙසේද?

අත්හදා බැලීම් සිදු කරන ජීවාත්මයකගේ පළමුවන ලක්ෂණය වන්නේ ඔහුගේ සංස්කාර සමග අත්හදා බැලීම් වලදී, ඔහු නිරන්තරයෙන් ජයග්‍රහණය ලැබීමයි. දෙවන ලක්ෂණය වන්නේ යෝගාව සමග අත්හදා බැලීම් සිදු කිරීමෙන් සොබාදහම තුළින් පැමිණෙන ඕනෑම අවස්ථාවකින් ඔහු ජය ගැනීමයි. විටින් විට සොබා දහමේ

කැලඹිලිද, යෝගී ජීවාත්මයන්ව ඒවා දෙසට ආකර්ෂණය කරයි. එවන් වෙලාවක ඔබ යෝගාවේ ක්‍රමවේදය සමග අත්හදා බැලීම් සිදු කරනවාද? යෝගී ජීවාත්මයකට, ශ්‍රේෂ්ඨ ජීවාත්මයකට, ඇතැම් විට සොබා දහම බලපෑම් ඇති කරන්නේ නැද්ද? ඔබ බ්‍රහ්මීණ් ජීවාත්මයි, වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්මයි, එබැවින් සොබා දහම, ඔය වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ගේ සේවකයෙකි. පාලකයා, සේවකයාගේ බලපෑම යටතට පත් වන්නේ නම් ඔබ කුමක් කියයිද? මෙකල, පහසුකම් සහ විමුක්තිය ලබා දීමේ ස්වරූපයෙන්, වඩාත්ම ශ්‍රේෂ්ඨ ජීවාත්ම මත පදාර්ථ බලපෑම් ඇති කරයි. ඔවුන්ගේ යෝගී ජීවිත පදනම් වී ඇත්තේ පහසුකම් සහ උපකරණ මතයි. ඔවුන්ට එතරම් පහසුකම් හෝ එතරම් උපකරණ නොතිබුණේ නම්, එවිට ඔවුන් එතරම් යෝග්‍යුක්ත වන්නේද නැත. මෙය බලපෑමකට හසුවීම ලෙස හැඳින්වෙයි. ආධ්‍යාත්මික උත්සාහ දරන යෝගී ජීවාත්මයක් සහ අත්හදා බැලීම් සිදු කරන ජීවාත්මයක් ඉදිරියේ, පහසුකම් සහ උපකරණ, ඉබේම මතුවෙයි. පහසුකම්, ඔබගේ ආධ්‍යාත්මික උත්සාහ වල පදනම කර නොගන්න, නමුත්, ඔබගේ ආධ්‍යාත්මික උත්සාහ, ඔබට ආධාර කිරීමට ඉබේටම පහසුකම් ගෙනැවිත් දෙයි. මෙය හැඳින්වෙන්නේ අත්හදා බැලීම් සිදු කරන ජීවාත්මයක් වීම ලෙසයි. එබැවින් ඔබ කෙතරම් දුරට ඔබගේ සංස්කාර පරිවර්ථනය කිරීමේ ජය ගෙන තිබේද, එමෙන්ම සොබාදහම ඇති කරන බලපෑම් ජයගෙන තිබේද, කියා පරීක්ෂා කර බලන්න. තුන්වන ලක්ෂණය වන්නේ පාපයන් ජය ගැනීමය. වෙනත් අයට පංච පාපයන් විෂ සර්පයෙක් වන අතර අත්හදා බැලීම් සිදු කරන ඔය යෝගී ජීවාත්මයන්ට මෙම සර්පයාද ඔබගේ ගෙල වටා මාලාවක් වෙයි. අද පවා බැතිමතුන් අශාරීරික තපස්වී ස්වරූපයෙන් ශංකර් ලෙස ඔය බ්‍රහමින්වරු සහ බ්‍රහ්ම පියාගේ සිහිවටනය සිහිකර වන්දනාමාන කරයි. තවත් සිහිවටනයක් වන්නේ මෙම සර්පයා ඔබට කෙතරම් යටහත් වන්නේද යත් ඔබ සතුටින් නර්ථනය කරන වේදිකාවක් බවට එය පත් වෙයි. ඔබ ජයග්‍රාහී වන විට ඔබ අත්විඳින්නේ කුමක්ද? ඒ වෙලාවේ ඔබගේ මනෝ ස්ථිතිය කෙබඳුද? ඔබ සතුටින් නර්ථනය කරනවා නේද? එබැවින් මෙම ස්ථිතිය වේදිකාවක් (නර්ථනය කිරීමට) ලෙස දිස් විය යුතුයි. අභ්‍යන්තර අවධානයත් ස්ථිතියක් ලෙස හැඳින්වෙනවා. මේ ආකාරයෙන් පාපයන් ජයගන්නා කෙනෙක් හැඳින්වෙන්නේ අත්හදා බැලීම් සිදු කරන අයෙක් ලෙසයි. එබැවින් ඔබ කෙතරම් දුරට අත්හදා බැලීම් සිදු කරන කෙනෙක්ද කියා පරීක්ෂා කර බලන්න. ඔබ නිසි වෙලාවට යෝගාව සමග අත්හදා බැලීම් සිදු කරන්නේ නැත්නම්, ඔබ නිසි වෙලාවට යෝගා ක්‍රමවේදය තුළින් සාර්ථකත්වය අත්කර ගන්නේ නැත්නම්, නිවැරදි ක්‍රමවේදය ලෙස ඔබ එය හඳුන්වයිද? කාලය විටින් විට එහි සීඝ්‍ර වේගය පෙන්වයි. සෑම ෙක්ෂත්‍රයක් තුළම බෙදීම්, අධර්මිෂ්ඨකම සහ අන්ත පිරිහීම වේගයෙන් වැඩි වෙනවා. එවන් කාලයක, යෝගාව භාවිතා කිරීමේ සීඝ්‍ර වැඩි වීමක් සහ නිවැරදි ක්‍රමවේදය භාවිතා කිරීමෙන් සාර්ථකත්වය වැඩි කිරීමේ අවශ්‍යතාවයක් තිබේ. එබැවින් ඉදිරි අංකයක් හිමි කරගැනීමේ පදනම වන්නේ, අත්හදා බැලීම් සිදුකරන කෙනෙක් වීමේ පහසු ක්‍රමවේදයයි. එසේ නම් බාප්දාදා දුටුවේ කුමක්ද? යෝගාව සමග අත්හදා බැලීම් සිදු කරන කාලයේ සීඝ්‍ර වේගයක් තිබෙනවා වෙනුවට ඔබට තිබෙන්නේ සාමන්‍ය වේගයක්. දැන් මෙම වේගය වැඩි කරන්න. එවිට කුමක් සිදු වෙයිද? නිවැරදි ක්‍රමවේදය භාවිතා කිරීමෙන් තමන් සාර්ථකත්වයේ ප්‍රතිමූර්ති බව ඔබ අත්දකියි. අද පවා ඔබගේ අජීවී ප්‍රතිමා තුළින් මිනිසුන් සාර්ථකත්වය අත්දකිනවා. ඔබ නිවැරදි ක්‍රමවේදය භාවිතා කිරීමෙන් සාර්ථකත්වයේ ප්‍රතිමූර්ති වූ නිසයි, ඔබගේ සිහිවටන දිගටම පැවතී තිබෙන්නේ. ඔබ ගුප්ත බල ඇති අය නොවෙයි, නමුත් නිවැරදි ක්‍රමවේදය භාවිතා කිරීම මඟින් සාර්ථකත්වය අත්කර ගන්නා අයයි. එබැවින් ඔබ කළ යුත්තේ කුමක්ද කියා ඔබට ඇසුණාද? ඔබට සෑම දෙයක්ම තිබෙනවා, නමුත් නිසි වෙලාවට එය සමග අත්හදා බැලීම් සිදු කර, එම අත්හදා බැලීම් වලින් සාර්ථක වීම හැඳින්වෙන්නේ, දැනුමේ ප්‍රතිමූර්තියක් වන ජීවාත්මයක් වීම ලෙසයි. දැනුමේ ප්‍රතිමූර්ති වන එවන් ජීවාත්ම උපරිම ලෙස සෙනෙහසට පාත්‍ර වන අතර ඔවුන් උපරිම ලෙස සමීපයි. අච්චා.

යෝගාවේ ක්‍රමවේදය භාවිතා කිරීමෙන් නිරන්තරයෙන් සාර්ථකත්වය අත්දකින අයට, තමන්ගේ සාමාන්‍ය සංස්කාර ශ්‍රේෂ්ඨ සංස්කාර බවට පරිවර්ථනය කිරීමෙන්, ලෝකය පරිවර්ථනය කරන ජීවාත්මයන්ට, පදාර්ථ ජය ගන්නා සහ පාපයන් ජයගන්නා ජයග්‍රාහී ජීවාත්මයන්ට, අත්හදා බැලීම් සිදු කරන වේගය, වේගවත් බව අත්දකින ජීවාත්මයන්ට, දැනුමේ ප්‍රතිමූර්ති සහ යෝග්‍යුක්ත වන අයට බාප්දාදාගෙන් සෙනෙහස, ස්මරණය සහ නමස්තේ.

(නොවැම්බර් මස 24 වන දින කුමාරීන් දෙදෙනෙකුගේ කැප වීමේ උත්සවයෙන් පසුව රාත්‍රී 10.00 ට ඕල් රවුන්ඩර් දාදී ඇගේ පැරණි ඇඳුම අතහැර බාප්දාදාගේ ඇකයට ගියා. 25 වන දින සවස ආදාහන කටයුතු සිදු විය. සවස මුරලියක් පැවසීමෙන් පසුව, දාදීන්ව මුණ ගැසෙන අතරතුර, බාප්දාදා මෙම ශ්‍රේෂ්ඨ වදන් පැවසීය)

ක්‍රීඩාව තුළ ඔබ තව විවිධ ක්‍රීඩා දිගින් දිගටම දකිනවා. නොබැඳි නරඹන්නෙක් විලසින් ක්‍රීඩාව නැරඹීමෙන් ඔබ විනෝදයක් ලබනවා නේද? එය උත්සවයක් වුණත් කෙනෙක් තම සිරුර අතහැර ගියත්, දෙකම දැනෙන්නේ කෙබඳු ආකාරයටද? ක්‍රීඩාව තුළ සිදුවන ක්‍රීඩාවක් පමණයි. තවද එය ක්‍රීඩාවක් මෙන් දැනෙනවා, එහෙම නේද? ක්‍රීඩාවක් එයට අයත් වෙලාවේ අවසන් වන සේම, සිදු වූ කුමක් වුණත් පහසුවෙන් අවසන් විය, එබැවින් එය දැනෙන්නේ ක්‍රීඩාවක් වගෙයි. සෑම ජීවාත්මයකටම තමන්ටම අයිති චරිත කොටසක් තිබෙනවා. ජීවාත්මයකට, සියලුම ජීවාත්මයන්ගෙන් සුබ පැතුම් ලැබීම, සෑම සියලු ජීවාත්මයන්ගෙන් සුබ ප්‍රාර්ථනා ලබා ගැනීම, ජීවාත්මයකගේ භාග්‍යයේ සාර්ථකත්වයයි. එබැවින් සිදු වූ දෙයින් ඔබ දුටුවේ කුමක්ද? ක්‍රීඩාවක්ද, මරණයක්ද? එක් පසෙකින් ඔබ අලෞකික විවාහ මංගල්‍යය දුටු අතර අනෙක් පසින් කෙනෙක් තම අලෞකික පැළඳුම වෙනස් කරන ක්‍රීඩාව ඔබ දුටුවා, නමුත් මේ දෙකින්ම හැඟී යන්නේ කුමක්ද? ක්‍රීඩාව තුළ සිදු වූ ක්‍රීඩාවක්. එහි වෙනසක් තිබෙනවාද? ඔබගේ මනෝ ස්ථිතියේ වෙනසක් ඇති වුණාද? අලෞකික විවාහ මංගල්‍යය සහ අලෞකික පැළඳුම වෙනස් කිරීම නැරඹීමේදී වෙනසක් ඇති වුණාද? රළ වල වෙනසක් ඇති වුණාද, නැද්ද? ඔබ නොබැඳි නරඹන්නෙක් ලෙසින් ක්‍රීඩාව නරඹන්නේ නම්, එවිට සෑම කෙනෙකුටම තමන්ටම අයත් ක්‍රමවේදයක් තිබේ. පහසුවෙන් බැඳීම් ජය ගැනීම, දීර්ඝ කාලයක් පුරාවට යෝගා ක්‍රමවේදය භාවිතා කිරීමෙන් සාර්ථකත්වය ලබා ගැනීමයි. එබැවින් කෙනෙක් බැඳීම් ජය ගත්තේ කෙසේද කියා ඔබ දුටුවා. පහසුවෙන් මිය යෑමේ ක්‍රීඩාව ඔබ දුටුවා. එබැවින් මෙම ක්‍රීඩාවේ වැදගත්කම කුමක්ද? ඔබගේ සිරුරේ අවධානයෙන් පවා ඔබ්බෙන් සිටීමයි. රෝගයක් නිසා හෝ නිවැරදි ආකාරයකින් වුවද, අවසානයේ වෙන කිසිවක් ඔබව ආකර්ෂණය නොකළ යුතුයි. මෙය හඳුන්වන්නේ ඔබගේ ඇඳුම පහසුවෙන් මාරු කිරීම ලෙසයි. එබැවින් ඔබ කළ යුත්තේ කුමක්ද? බැඳීම් ජයගත් අය වීම සඳහා ඔබගේ මධ්‍යස්ථාන පවා ඔබට සිහි නොවිය යුතුයි. ගුරුවරු මෙහි අසුන්ගෙන සිටිනවා. ඔබගේ එක් ශිෂ්‍යයෙක්ව හෝ ඔබගේ මධ්‍යස්ථානයට අයත් එක දෙයක් හෝ ඔබට සිහි නොවිය යුතුයි ඔබ පසෙකින් තබා ඇති දෙයක් ඔබට සිහි නොවිය යුතුයි. සියලු දෙනාගෙන් වෙන්වී, බාබාගේ සෙනෙහස ලැබීමට, ඔබ කල්තියාම සෑම පැත්තකින්ම නිදහස් විය යුතුයි. එය මෙහෙමද? එසේ නැත්නම් ඔබ ඇතැම් පැති වලින් ආධාර ගන්නවාද? ඔබගේ ගමනාන්තය හැර වෙනත් කිසිම දේකට බැඳීමක් නොතිබිය යුතුයි. අච්චා.

**බාප්දාදා නිර්මල් ශාන්තා දාදීව මුණගැසෙමින්**

ඔබ සමූහයට කැමතිද? සමූහයේ විශේෂ සුන්දරත්වයක් තිබෙනවා. සෑම කෙනෙකුගේම දෘෂ්ඨිය බොහෝ සෙනෙහසින් ඔබ සියලු දෙනා මතට යයි. කෙතරම් සේවයක් තිබෙන්නේද, එතරම් සේවයක් සිරුර මඟින් සිදු විය යුතුයි. කුමන ආකාරයකින් වුවද සිරුර නොකඩවා ක්‍රියාත්මක වෙයි. සිරුර මඟින් ක්‍රියා කරන්නේ කෙසේද කියා ඔබ දැන් දන්නවා, එහෙම නේද? එය හොඳින් ක්‍රියාත්මක වෙනවා, මන්ද, ඔබට පියාගේ ආශිර්වාද මෙන්ම සියලු දෙනාගේ ආශිර්වාද ද තිබෙනවා. ඔබ සතුටින් රැඳී සිට සියලු දෙනා සමග සතුට බෙදා ගත යුතුයි. වෙන කිරීමට ඇත්තේ කුමක්ද? ඔබව දැකීමෙන් සියලු දෙනා බොහෝ සතුටු වනවා, එබැවින් ඔබ සතුට බෙදා ගන්නවා නේද? ඔබ බුදින අතර බෙදා හදා ගන්නවා. ඔය සෑම කෙනෙක්ම දර්ශන ලබා දෙන ප්‍රතිරූය. සියලු දෙනාගේ දෘෂ්ඨිය පතිත වන්නේ උපකරණ ජීවාත්ම මතයි, එබැවින් ඔබ දර්ශන ලබා දෙන ප්‍රතිරූ වී ඇත. අච්චා.

**අව්‍යක්ත බාප්දාදා සමග පෞද්ගලික හමුවීම්**

බ්‍රාහ්මණ දිවියේ අත්තිවාරම වන්නේ ස්මරණය සහ සේවයයි නාටකයට අනුව ඔබ සියලු දෙනාටම බ්‍රාහ්මණ දිවියේ සේවය කිරීමට අවස්ථාවක් ලැබී තිබෙනවා නේද? මන්ද, බ්‍රාහ්මණ දිවියේ පදනම වන්නේ සිහි කිරීම සහ සේවයයි. සිහි කිරීම සහ සේවය දුර්වල නම්, එය ඔබගේ ශරීරය රෝගී වී, එයට ඖෂධ මඟින් තල්ලුවක් දීමට සිදුවෙනවා වැනිය. ඒ ආකාරයෙන්ම බ්‍රාහ්මණ දිවියේ, සිහි කිරීමේ සහ සේවයේ අත්තිවාරම ශක්තිමත් නැත්නම්, එය දුර්වල නම්, ඔබ විටෙක වේගයෙන් ගමන් කරන අතර විටෙක සෙමින් ගමන් කරයි, එමෙන්ම විටෙක ගමන් කරන්නේ තල්ලුවකින්ය. ඔබට සහයෝගය ඇත්නම්, ඔබට ඇසුරු කිරීමට අය සිටියි නම්, අවස්ථාව තිබේ නම්, එවිට ඔබ ගමන් කරයි, එසේ නොමැති නම් ඔබ මන්දගාමී වෙයි. මේ නිසයි ස්මරණයේ සහ සේවයේ විශේෂ අත්තිවාරම සෑම විටම ශක්තිමත්ව තිබිය යුත්තේ. දෙකම ශක්තිමත් විය යුතුයි. කිරීමට බොහෝ සේවය තිබේ, නමුත් ඔබ ස්මරණයේ සිටීමේ දුර්වල නම් හෝ ඔබ ස්මරණයේ සිටීමේ හොඳ වන නමුත් සේවය කිරීමේ දුර්වල නම්, එවිටද සීඝ්‍ර වේගයක් තිබිය නොහැක. සිහි කිරීම සහ සේවය කිරීම යන

දෙකේම සීඝ්‍ර වේගයක් තිබිය යුතුයි. දෙකම ශක්තිමත් විය යුතුයි. එබැවින් දෙකම ශක්තිමත්ද නැත්නම් වෙනසක් තිබෙනවාද? ඇතැම් විට සේවය වැඩියෙන් තිබෙන අතර විටෙක සිහි කිරීම වැඩියෙන් තිබෙනවාද? දෙකම එකට තිබිය යුතුයි. ස්මරණය සහ පරහිතකාමී සේවය. ආත්මාර්ථකාමී සේවය නොවෙයි, නමුත් පරහිතකාමී සේවය ඇත්නම්, එවිට ඔබට මායා පරාජය කරන්නෙක් වීම ඉතා පහසු වෙනවා. සෑම ක්‍රියාවකම, ක්‍රියාව සම්පූර්ණ කිරීමටත් පෙර වුණත්, ඔබට සෑම විටම ජයග්‍රහණය දැකීමට හැකි වෙයි. ජයග්‍රහණය දැනටමත් සහතික බවට බොහෝ ස්ථිර විශ්වාසයක් ඔබ අත්දකිවි. බ්‍රහ්මීණ් ජීවාත්ම ජයග්‍රහණය නොලබන්නේ නම්, ජය ලබන්නේ වෙන කවුද? ජය ලබන්නේ ක්ෂත්‍රියයන්ද? එය බ්‍රහ්මින්වරුන්ගේ ජයග්‍රහණයයි, එහෙම නේද? ප්‍රශ්නාර්ථ ලකුණු කිසිවක් නොතිබෙයි. 'මා එය කරනවා. මා ගමන් කරනවා. අප ඒ ගැන බලමු. එය සිදුවෙයි. එය සිදුවිය යුතුයි...' එවන් වදන් නොමැති වෙයි. 'කුමක් වෙයිද කියා මා නොදනී. එය සිදුවෙයිද, නොවෙයිද?' මේවා විශ්වාසය තිබීමේ වචනද? විශ්වාසය ඇති බුද්ධියක් ජය ලබනවා කියා, සිහි කර තිබෙනවා, එහෙම නේද? එය ප්‍රායෝගිකව සිදුවී ඇති නිසයි එසේ සිහි කෙරෙන්නේ. බුද්ධියේ විශ්වාසය තිබීමේ ලක්ෂණය වන්නේ සහතික වූ ජයග්‍රහණයයි. නිදසුනක් ලෙස, මිනිසුන්ට ඕනෑම ආකාරයක බලය ඇති විට, එය ඔවුන්ගේ ධනය, ඔවුන්ගේ බුද්ධිය, ඔවුන්ගේ නෑ සම්බන්ධතා වුවද විය හැක, එවිට යම් දෙයක් ලොකු දෙයක් නොවන බව, එය ඉතා සුළු දෙයක් බවට විශ්වාසය ඔවුන් තුළ තිබේ. ඔබට සියලු බල තිබේ. ඔබට ධනයේ බලය තිබේ, එසේ නැත්නම් ධනයේ බලය තිබෙන්නේ කෝටිපතියන්ටද? ශ්‍රේෂ්ඨතම ධනය වන්නේ ඔබත් සමග සෑම විටම තිබෙන මෙම අවිනාශී ධනයයි. එබැවින් ඔබට ධනයේ බලය තිබේ, ඔබට බුද්ධියේ බලයත් තිබෙනවා, ඔබට තත්ත්වයේ බලයත් තිබෙනවා. සිහි කර ඇති සියලු බල ඔබ තුළ තිබෙනවා. ඔබට ඒවා තිබෙනවාද එසේ නැත්නම් විටෙක ඒවා අතුරුදහන් වෙනවාද? මේවා ඔබ තුළ ඉස්මතු වී තිබීම අත්දකින්න. එය මෙසේ නොවිය යුතුයි ඔව්, මම සර්ව බලධරියාගේ දරුවෙක්මි, සියලු බල ඇති කෙනෙක්, නමුත් මා එය අත්දකින්නේ නැහැ. එසේ නම් ඔබ සියලු දෙනාම පිරිපුන්ද, නැත්නම් ටිකක් හිස්ද? නිසි වෙලාවට නිවැරදි ක්‍රමවේදය භාවිතා කර සාර්ථකත්වය අත්කර ගන්න. එය වෙලාවට සිදු නොවන නමුත් ඔබට බොහෝ බල තිබෙන බවට කුල්මත් බව තිබීම, නොවිය යුතුයි. ඔබගේ බල කිසිම විටෙක අමතක නොකරන්න, ඒවා නොකඩවා භාවිතා කරන්න. මේවා තමන් වෙනුවෙන් භාවිතා කරන අන්දම ඔබ දන්නේ නම්, එවිට ඔබට අන් අය වෙනුවෙන්ද ඒවා භාවිතා කිරීමට හැකි වෙයි. ඔය පාණ්ඩවයන්ට බලය තිබෙනවාද, නැත්නම් ඔබට විටෙක තරහ යනවාද? ඔබට ටිකක් තරහ යනවාද? වෙන කෙනෙක් කෝප වූ විට ඔබට ටිකක් තරහ යනවාද? කෙනෙක් ඔබට අපහාස කරන විට ඔබට තරහ යනවාද? මෙය, සතුරෙක් පැමිණි විට ඔබ පරාජය වන බව පැවසීම වැනිය. මච්චරුන්ට බැඳීම් ටිකක් තිබෙනවාද? සෑම කල්පයකදීම ජයගැනීමේ සතුට පාණ්ඩවයන් තුළ සෑම විටම ඉස්මතු කර තබාගන්න. පාණ්ඩවයන්ව සිහි කරන ඕනෑම විටෙක, 'පාණ්ඩව' යන වචනය සමගම ජයග්‍රහණයද ඔවුන් ඉදිරියට පැමිණෙනවා, එහෙම නේද? පාණ්ඩව යනු, ජයග්‍රහණයයි. පාණ්ඩවයන්ගේ කතා පුවතේ වැදගත්කම කුමක්ද? එය ජයග්‍රහණයයි, එහෙම නේද? එබැවින් ඔබ සෑම චක්‍රයකදීම ජය ලබයි. මෙම කුල්මත් බව මතුකර ගන්න, එය යටපත් නොකරන්න. අච්චා.

## 2) සියලු දෙනාගෙන් ගෞරවය ලබා ගැනීමට නිහතමානී වන්න.

ඔබ, කෝටි ගණනකින් සුළු පිරිසක් සහ එම සුළු පිරිසෙන් අතලොස්සක් වන ශ්‍රේෂ්ඨ ජීවාත්ම බව, ඔබ සියලු දෙනාම අත්දකිනවාද? එසේ නැත්නම් 'සුළු පිරිසෙන් අතලොස්සක්' යනු, වෙන අයද? නැත්නම් එම අය, ඔබද? එබැවින් සෑම ජීවාත්මයකටම විශාල වැදගත්කමක් තිබෙනවා, එනම්, සෑම ජීවාත්මයක්ම ශ්‍රේෂ්ඨයි. සෑම කෙනෙක්ම කෙතරම් ශ්‍රේෂ්ඨ වන්නේද, ශ්‍රේෂ්ඨත්වයේ ලක්ෂණය වන්නේ, ඔවුන් ශ්‍රේෂ්ඨ වන තරමට නිහතමානීය, මන්ද, ඔවුන් නිරන්තරයෙන් පිරිපුන්ය. ගසක් ගැන කියන්නේ ගසක් ඵලින් බර වන තරමට, එය වැඩියෙන් බිමට නැමෙයි, එබැවින් නිහතමානිකමින්, සේවයක් සිදු වෙයි. ගසක් බිමට බර වීමෙන් සේවයක් සිදුවන අතර, එය බිමට නැමී නොමැති නම් ඉන් සේවයක් සිදු නොවෙයි. එබැවින් එක් අතකින් ශ්‍රේෂ්ඨත්වය තිබෙන අතර අනෙක් අතට නිහතමානිකම තිබේ, එමෙන්ම ශ්‍රේෂ්ඨ අයට සියලු දෙනාගේ ගෞරවය හිමි වෙයි. ඔබ නිරහංකාර නම් අන් අය ඔබට ගරු කරයි. අහංකාරකම ඇති අයට කිසිවෙක් ගරු නොකරයි. එවන් ජීවාත්මයකගෙන් ඔවුන් ඉවත්ව පැන දුවයි. එබැවින් කෙනෙක් ශ්‍රේෂ්ඨද, නිහතමානිද, එහි ලක්ෂණය වන්නේ නිහතමානී පුද්ගලයෙක් සෑම කෙනෙකුටම සතුට ලබා දෙයි. ඔවුන් කොහේ ගියත්, ඔවුන් කුමක් කළත්, ඔවුන් සතුට දානය කරයි. මේ ආකාරයෙන් ඔබ කෙතරම් ශ්‍රේෂ්ඨද කියා පරීක්ෂා කර බලන්න! ඔබ සමග නෑ සම්බන්ධතාවයකට පැමිණෙන ඕනෑම කෙනෙක් සතුට අත්විඳිය යුතුයි. එය මෙහෙමද, නොඑසේ නම් ඔවුන්ට දුකත් තිබෙනවාද? නිහතමානිකම නොමැති නම්, එවිට ඔබට සෑම විටම සතුට ලබා දීමට නොහැකි වෙයි.

එබැවින් ඔබ සෑම විටම සතුට දී, සතුට ලබා ගන්නවාද, නැත්නම් ඔබ විටෙක දුක සිදු කර, දුක ගන්නවාද? හොඳයි, ඔබ දුක ඇති කරන්නේ නැහැ, නමුත් ඔබ එය ගන්නවාද? ඔබට හැඟීම් ඇති වෙනවා, එසේ නම් ඔබ එය ගත්තා, නේද? ඔබට යමක් සුළුවෙන් හැඟෙනවා නම්, එය දුක ගැනීමයි, එහෙම නේද? කෙසේවෙතත්, කෙනෙක් යමක් දෙන නමුත් ඔබ එය නොගන්නේ නම්, එවිට එය රඳා පවතින්නේ ඔබ මතයි, එහෙම නේද? දුක පමණක් ඇති කෙනෙක් දෙන්නේ මොනවාද? ඔහු ලබා දෙන්නේ දුක පමණයි, එහෙම නේද? කෙසේවෙතත්, ඔබගේ යුතුකම වන්නේ සතුට ගැනීම සහ සතුට දීමයි. කෙනෙක් ඔබට දුක ඇති කරන අතර ඔබ මෙසේ පැවසීම සිදුනොවිය යුතුයි, 'මා කුමක් කරන්නද? මා දුක ඇති කළේ නැහැ නමුත් අනෙකා මට දුක ඇති කළා.' ඔබ ගත යුත්තේ කුමක්ද, නොගත යුත්තේ කුමක්ද කියා ඔබ පරීක්ෂා කළ යුතුයි. ඔබ ගන්න දේවල් අතින් ඔබ දක්ෂ විය යුතුයි, මේ නිසයි, බ්‍රහ්මින් ජීවාත්ම ගැන මෙසේ සිහි කර තිබෙන්නේ සතුටු සාගරයේ දරුවන්, සතුටේ ප්‍රතිමූර්ති, සතුට ප්‍රදානය කරන අය. එබැවින් ඔබ සතුටේ ප්‍රතිමූර්තිය, සතුට ප්‍රදානය කරන ජීවාත්මයි. ඔබ දුක් ලෝකයෙන් පිටව ගොසින්ය. ඔබ ඉන් ඉවතට පියවර තබා තිබේද, නැත්නම් ඔබගේ එක පාදයක් දුක් දේශයේ තිබෙන අතර එක පාදයක් සංගම යුගයේ තබා තිබෙනවාද? ඔබගේ බුද්ධිය තවමත් සුළු වශයෙන් එහි ඇදී යන්නේ නැහැ නේද? පාදයක් එහි නොමැති නමුත් පාදයේ ඇඟිල්ලක් තවමත් එහි ඉතිරි වී තිබෙනවාද? ඔබ දුක් දේශයෙන් පිටවී ඇති බැවින් ඔබ දුක නොගත යුතු අතර දුක ලබා නොදිය යුතුයි. අච්ඡා.

**වරදානය:** ඔබගේ පියාසර ස්ථිතියෙන්, ඔබ ලෝකයේ පාලකයෙක් වී, පියා මෙන් චක්‍රය වටේම යන චරිත කොටසක් රඟපාන්න.

පියා, විවිධ චරිත රඟපාන (ඕල්-රවුන්ඩ්) නළුවෙකි, ඔහුට මිතුරෙක් විය හැකි සේම, පියාද විය හැක. ඒ අන්දමින්ම, පියාසර ස්ථිතිය ඇති අයට, සේවය සිදුකිරීමට අවශ්‍ය ඕනෑම විටෙක, පරිසමාප්ත චරිත කොටසක් රඟ පෑමට හැකි වෙයි. මෙය හැඳින්වෙන්නේ විවිධ චරිත කොටස් රඟන පියාසර පක්ෂියෙක් වීම (all-round flying bird) ලෙසයි. ඔවුන් බන්දන වලින් නිදහස්ව සිටින අතර සේවය කිරීමට අවශ්‍ය ඕනෑම තැනකට යයි. ඔවුන් සියලු අන්දමේ සේවාවන්හි සාර්ථකත්වයේ ප්‍රතිරූප වෙයි. එවන් ජීවාත්ම, ලෝක පාලකයන්, විවිධ චරිත රඟපාන නළුවන් (all-round actors) ලෙස හැඳින්වෙයි.

**පාඨය:** එකිනෙකාගේ විශේෂතා ඔබගේ අවධානයේ තබා ගැනීමෙන් විශ්වාසනීය වන්න, එවිට සමූහය

***** ඕම් ශාන්ති *****

එකමුතු වෙයි.